දිනය: 2023.05.22
අංකය: 47

**<u>මාධ්‍ය නිවේදනයයි</u>**
**<u>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව</u>**

රුසියාව හා යුක්රේනය අතර වර්ධනය වී ඇති භූ-දේශපාලනික අර්බුධය, රුසියානු හා යුක්රේන සංචාරකයින්ට නැවත තම මව් රටවල් කරා යාමට නොහැකි වන අයුරින් ගගනතල තහනමකටත්, ප්‍රදේශයේ ගුවන් යානා මෙහෙයුම් නොකිරීමටත් හේතුවී ඇත.

ඒ අනුව,**2022.02.28** දිනට වලංගු සංචාරක වීසා දැරූ රුසියානු හා යුක්රේන සංචාරකයින්ගේ වලංගු වීසා කාලසීමාව ගාස්තු ගෙවීමකින් තොරව **2023.06.22** දින දක්වා මාස 01 කින් තවදුරටත් දීර්ඝ කර ඇත. **<u>පැමිණීමේ වීසා (visit visa) ගාස්තු</u>** ගෙවීමකින් තොර පදනමින් දීර්ඝ කර ගැනීම සඳහා සුදුසුකම් සහිත පුද්ගලයන් ආගමන හා විගමන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයට පැමිණ හෝ මාර්ගගත ලෙස හෝ තම වීසා දීර්ඝ කර ගැනීම සඳහා අයදුම් කළ යුතුවේ.

තවද, මෙම සංචාරකයින්ට තම මව්රටවල් වෙත නැවත යාමේදී කිසිදු බාධාවකින්තොරව ශ්‍රී ලංකා ගුවන් තොටුපලවලින් පිටත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව